රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

# 2024-04-08 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

## 01. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා උපාධිය සඳහා ගෙවීමේ පදනම මත ශිෂ්‍යයින් ඇතුළත් කර ගැනීම

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, 1988 අංක 27 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය (සංශෝධන) පනත මඟින් විශ්වවිද්‍යාලයක් බවට පත් කර ඇත. සන්නද්ධ සේවාවන්හි සේවා අවශ්‍යතාව අනුව වෛද්‍ය වෘත්තිකයින් වශයෙන් ශිෂ්‍යභට නිලධාරින් පුහුණු කර වෛද්‍යවේදය සහ ශල්‍ය වෛද්‍යවේදය (MBBS) උපාධි පිරිනැමීම පිණිස 2011 වර්ෂයේදී මෙම විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ආරම්භ කර තිබේ. ඒ අනුව, දැනට දේශීය සිසුන් සඳහා ත්‍රිවිධ හමුදාවට හෝ පොලිසියට කැඩෙට් නිලධාරියෙකු ලෙස බැඳීමෙන් පමණක් සහ විදේශීය සුදුසුකම් ලත් සිසුන් සඳහා මුදල් ගෙවීමේ පදනම මත පමණක් එම විශ්වවිද්‍යාලයේ වෛද්‍ය උපාධිය හැදෑරීමේ අවස්ථාව ලබා ගත හැකි වේ. එම අවස්ථාව තවදුරටත් පුළුල් කරමින් 2024 අධ්‍යයන වර්ෂයේ සිට සුදුසුකම් සපුරා ඇති දේශීය අයදුම්කරුවන් ද මුදල් ගෙවීමේ පදනම මත වෛද්‍ය උපාධි පාඨමාලාව සඳහා බඳවාගැනීමට සැලසුම් කර තිබේ. ඒ අනුව, ශ්‍රී ලංකාවේ අනෙකුත් ජාතික විශ්වවිද්‍යාලවල සිසුන් බඳවාගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුගමනය කරනු ලබන Z අගයට (Z Score) අමතරව තවත් අතිරේක සුදුසුකම් කිහිපයක් ද සහිතව සකස් කරනු ලැබ ඇති නිර්ණායක අනුගමනය කරමින්, ගෙවීමේ පදනම මත වෛද්‍යවේදය හා ශල්‍ය වෛද්‍යවේදය උපාධි හැදෑරීම සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය වෙත උපාධි අපේක්ෂකයන් ඇතුළත් කර ගැනීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 02. ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායට අයත් කිරින්ද උසස් පුහුණු ආයතනය තුළ නැව් සමාකෘතික ව්‍යාපෘතියක් ආරම්භ කිරීම

2009 අංක 41 දරන වෙරළාරක්ෂක දෙපාර්තමේන්තු පනත මඟින් ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇති අතර, ශ්‍රී ලංකාවේ වෙරළබඩ ජල තීරයෙහි සහ ගැඹුරු මුහුදෙහි ආරක්ෂාව සහතික කිරීම, මෙරටට නීතිවිරෝධී ආගමනිකයන් ඇතුළු වීම හා මෙරටින් නීතිවිරෝධී

විගමනිකයන් පිටවීම වැළැක්වීම, සමුද්‍රීය ගමනාගමනයෙහි සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා සහාය වීම, සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීම සහ සමුද්‍රීය ව්‍යසන වැළැක්වීම හා පාලනය යන කාර්යයන් ඉටු කිරීම එම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. එකී රාජකාරීන්හි වෘත්තීමයභාවය හා නෛතික තත්ත්වය ආරක්ෂා වන අයුරින් කටයුතු කිරීම සඳහා විවිධ අන්තර්ජාතික සංවිධාන හා ගෝලීය වෙරළාරක්ෂක බලකායන් සමඟ එක්ව එම දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි. ඒ අනුව, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක නිලධාරීන් පුහුණු කිරීම පිණිස ඇමෙරිකා එක්සත් ජනපද රාජ්‍ය අපනයන පාලන සහ දේශසීමා ආරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ නැව් සමාකෘතික ව්‍යාපෘතියක් ඇමෙරිකානු ඩොලර් 355,575ක (සියලු බදු සහිත) පූර්ණ ප්‍රදානයක් ලෙස ලබා දීමට ඇමෙරිකා එක්සත් ජනපදය විසින් එකඟතාව පළ කර තිබේ. එම ව්‍යාපෘතිය කිරින්ද උසස් පුහුණු මධ්‍යස්ථානය තුළ ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 03. **පානීය ජලය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ජල සුරක්ෂිතතාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය**

පානීය ජල සැපයුම් සේවා අංශයේ පැන නැගී ඇති ප්‍රවණතා හා අභියෝගවලට මුහුණ දීම පිණිස වඩාත් පුළුල් සහ යාවත්කාලීන ප්‍රවේශයක අවශ්‍යතාව හඳුනාගෙන තිබේ. ඒ අනුව, අදාළ ක්ෂේත්‍රයේ විශේෂඥයින්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ උපදේශනය මෙන්ම මහජන අදහස් ද ලබාගෙන වර්තමාන හා අනාගත අවශ්‍යතාවන්ට ගැළපෙන අයුරින්, "පානීය ජලය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය" සහ "ජල සුරක්ෂිතතාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය" සකස් කරනු ලැබ ඇත. එමඟින්, සියලුම පුරවැසියන් සඳහා ආරක්ෂිත සහ ගුණාත්මක පානීය ජලය සඳහා ඇති ප්‍රවේශය සහතික කිරීම, තිරසර ජල භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ ජල අංශයේ ආර්ථික වර්ධනය හා සමෘද්ධිය ප්‍රවර්ධනය කිරීම යන අරමුණු සාක්ෂාත් කර ගැනීම අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, "පානීය ජලය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය" සහ "ජල සුරක්ෂිතතාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය" ඊට අදාළ අනෙකුත් ප්‍රතිපත්තීන් සමඟ යෝග්‍ය පරිදි ඒකාබද්ධ කර ක්‍රියාත්මක කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**04. රජයේ ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ඉඩම් පැවරීම**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කන්කසන්තුරය වරාය සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් ඉඩම් අක්කර 50ක් පමණ අත්පත් කර ගැනීමට හෝ මිල දී ගැනීමට 2017-12-12 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත අදාළ ඉඩම් පවරා ගැනීම සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත අත්තිකාරම් ගෙවීමක් වශයෙන් රුපියල් මිලියන 52ක මුදලක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මේ වන විට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වෙත ගෙවා ඇත. ඒ අනුව, හඳුනාගනු ලැබ ඇති අක්කර 23 පර්චස් 12ක් වන ඉඩම් කොටස් කිහිපයක් විධිමත් නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කරමින් රජයේ ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 6(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත නිරවුල් අයිතිය සහිත ප්‍රදානයන් වශයෙන් පවරා ගැනීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් සහ ඔස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම**

පර්යේෂණ හා නවෝත්පාදන ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා සහයෝගිතාවක් ඇති කර ගැනීම පිණිස ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් සහ ඔස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීමට යෝජනා වී ඇත. පර්යේෂණ සහ සේවා සහිත ඒකාබද්ධ යෝජනාවන් සැකසීම, නවෝත්පාදන, තාක්ෂණික සංවර්ධනය සහ දැනුම බෙදා හැරීම, පර්යේෂණ ද්‍රව්‍ය හුවමාරු කර ගැනීම, විද්වතුන්, විද්‍යාඥයන් සහ ශිෂ්‍යයන් හුවමාරු කර ගැනීම, සහයෝගිතා සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පර්යේෂණ සබැඳි ක්‍රියාකාරකම් පැවැත්වීම ආදී කාර්යයන් රාශියක් අන්තර්ගත යෝජිත කෙටුම්පත් අවබෝධතා ගිවිසුම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාව සහ නීතිපති දෙපාර්තමේන්තුවේ නිෂ්කාශනය ලැබී තිබේ. ඒ අනුව, දෙපාර්ශ්වය අතර එකී අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 06. කෘෂි නවෝත්පාදන වැඩපිළිවෙල ඉදිරියට ගෙන යාම සඳහා තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන පිහිටුවීමේ ව්‍යාපෘතිය

කෘෂි කර්මාන්තය වෙත තරුණ ප්‍රජාවගේ ආකර්ෂණය ලබා ගැනීම සහ ඔවුන්ගේ ආර්ථික තත්ත්වය වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් තරුණ කෘෂි ව්‍යවසායකත්ව ප්‍රජාවක් නිර්මාණය කිරීම සඳහා සහ කෘෂිකාර්මික ප්‍රදේශ වෙත කෘෂි නවෝත්පාදනය හඳුන්වා දීම සඳහා තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන පිහිටුවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. එහි ප්‍රථම අදියර වශයෙන්, 2024 වර්ෂයේදී තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තිහිපයක එක් ගමක් බැගින් වන සේ තෝරාගෙන කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන පිහිටුවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමටත්, නව තාක්ෂණය සහ සුහුරු තාක්ෂණය භාවිත කිරීම සඳහා තරුණ ගොවි ප්‍රජාවට පහසුකම් සැලසීමටත් කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 07. ශ්‍රී ලංකාව සහ චැඩ් ජනරජය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇති කර ගැනීම

ශ්‍රී ලංකාව මේ වන විට අප්‍රිකානු මහාද්වීපයේ රටවල් 46ක් සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇති කර ගෙන ඇති අතර, චැඩ් ජනරජය ද ශ්‍රී ලංකාව සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇති කර ගැනීමට සිය කැමැත්ත ප්‍රකාශ කර ඇත. බහුපාර්ශ්වීය හවුල්කරුවකු ලෙස චැඩ් ජනරජය විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ සහ අනෙකුත් බහුපාර්ශ්වීය සම්මේලනවලදී ශ්‍රී ලංකාවට සහාය පළ කර තිබේ. ඒ අනුව, චැඩ් ජනරජය සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇති කර ගැනීම පිණිස විදේශ කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 08. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ පාර්ලිමේන්තු අනුමැතිය සඳහා නියමයක් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ තීරුබදු ලිහිල්කරණ වැඩසටහන නැවත ක්‍රියාත්මක කිරීම සඳහා 2023-05-29 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දෙන ලදී. 2018-05-01 දින වන විට සෙස් බද්ද ක්‍රියාත්මක වූ ආකාරය සැලකිල්ලට ගෙන එම වැඩසටහන '0 කාණ්ඩය', '10 කාණ්ඩය' සහ 'X කාණ්ඩය' ලෙස කාණ්ඩ තුනකට වෙන් කර තිබේ. ඒ අනුව, '10 කාණ්ඩය' යටතේ වර්ගීකරණය කර ඇති සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 1,087ක් සඳහා අදාළ සෙස්

බද්දෙන් 1/5ක් වූ පළමු වාර්ෂික වාරිකය ඉවත් කිරීම සහ "0" කාණ්ඩය යටතේ වර්ගීකරණය කරන ලද සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 300ක් සඳහා අදාළ වන සෙස් බද්ද එකවර ඉවත් කිරීම බලාත්මක කිරීම සඳහා 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ විධිවිධාන යටතේ වන නියමයක් 2024-01-04 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එකී නියමය පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම පිණිස ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 09. ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාර වශයෙන් නම් කිරීම

පහත සඳහන් සමාගම් ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාර වශයෙන් නම් කර, එම සමාගම් වෙත කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනතේ II උපලේඛනය යටතේ සඳහන් පනත්වලින් නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීමටත්, ඒ සඳහා වන නියමයන් ගැසට් නිවේදන මඟින් ප්‍රකාශයට පත් කිරීමටත් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

- PORT CITY BPO (PRIVATE) LIMITED - විදේශීය විනෝදාස්වාද කර්මාන්තය සඳහා ව්‍යාපාර ක්‍රියාවලි බාහිර ප්‍රභවයන්ට ලබා දීමේ සේවාවන් සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා.

- IVIVA PTE LTD - කාබන් අවම ආර්ථිකයකට මාරු වීම සඳහා ගෝලීය සේවාලාභීන්ගේ විවිධ කාර්යයන්ට සහාය වීම පිණිස සුහුරු නගර තොරතුරු තාක්ෂණය මඟින් බලගැන්වූ නිෂ්පාදන සහ විසඳුම් නිර්මාණය කරනු ලබන තොරතුරු තාක්ෂණ සේවා සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා.

- ECHELON TRADE (PVT) LTD - බහුවිධ ගෝලීය වෙළෙඳපොළවල් හරහා රෙදිපිළි, ඇඟළුම්, සුඛෝපභෝගී අත් ඔරලෝසු, රත්න් හා මැණික්, විදුලි උපකරණ සහ රූපලාවන්‍ය භාණ්ඩ වෙළෙඳාම පිණිස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා.

- 99X TECHNOLOGY AS – නිෂ්පාදන ඉංජිනේරු සහ නවෝත්පාදනය මෙන්ම වෙබ් අඩවි වැඩිදියුණු කිරීම, ජංගම යෙදවුම් වැඩිදියුණු කිරීම මඟින් තථ්‍ය පරිශීලක ගැටලුවලට ඩිජිටල් විසඳුම් සැකසීම සඳහා ගෝලීය ස්වාධීන මෘදුකාංග ව්‍යාපාරිකයන්ට සේවය සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා.

**10. "සැමට ඉංග්‍රීසි" වැඩසටහන යටතේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම සිදු කරන ගුරුවරු 2,500ක් බඳවාගැනීම**

ඉංග්‍රීසි මාධ්‍යයෙන් සාමාන්‍ය පෙළ විෂයයන් ඉගැන්වීම සඳහා දැනට අනුමත ගුරුවරුන් සංඛ්‍යාව 4,441ක් වුවත්, ඒ සඳහා ගුරුවරුන් 6,500ක පමණ අවශ්‍යතාවක් පවතින බවත්, බොහෝ පාසල්වල දැනට සේවයේ නියුතු ගුරුවරු සංඛ්‍යාවට අතිරේකව අවශ්‍ය කටයුතු සැලසුම් කරගනිමින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම පුළුල් කර ඇති බවත් පාසල් 765ක් සම්බන්ධයෙන් සිදු කරන ලද ඇගයීමකදී හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, දැනට ඉංග්‍රීසි මාධ්‍යයෙන් විෂයයන් ඉගැන්වීම සිදු කරනු ලබන පාසල් 765ක ප්‍රමාණය 2024 වර්ෂය තුළදී පාසල් 1,000ක් දක්වා වැඩි කරමින් ගුරු අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් විෂයයන් උගන්වනු ලබන අනුමත ගුරුවරු සංඛ්‍යාව 6,500 දක්වා වැඩි කිරීමටත්, ඒ සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් විෂයයන් උගන්වනු ලබන ගුරුවරුන් 2,500ක් බඳවා ගැනීමටත් ගරු ජනාධිපතිතුමා සහ අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**11. ඡන්ද විමසීම සඳහා වන ඇප තැන්පත් මුදල් සංශෝධනය කිරීම**

ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ පනතේ, පාර්ලිමේන්තු මැතිවරණ පනතේ සහ පළාත් සභා ඡන්ද විමසීම් පනතේ විධිවිධාන පරිදි දැනට පවතින ඇප තැන්පතු මුදල් සීමාවන් කාලෝචිත පරිදි වත්මන් සමාජ, ආර්ථික සහ දේශපාලන පසුබිම අනුව යාවත්කාලීන කිරීම සුදුසු බවට හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, පහත පරිදි අදාළ ඇප තැන්පත් මුදල් සංශෝධනය කිරීම පිණිස පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස ගරු ජනාධිපතිතුමා සහ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ පනතට අනුව පිළිගත් දේශපාලන පක්ෂයකින් ඉදිරිපත් වන අපේක්ෂකයෙකුගේ ඇප තැන්පතුව රුපියල් මිලියන 2.6 දක්වාත්, ස්වාධීන අපේක්ෂකයෙකුගේ ඇප තැන්පතුව රුපියල් මිලියන 3.1 දක්වාත් ඉහළ නැංවීම.

* 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතට අනුව පිළිගත් දේශපාලන පක්ෂයකින් ඉදිරිපත් වන එක් අපේක්ෂකයෙකුගේ ඇප තැන්පතුව රුපියල් 11,000/- දක්වාත්, ස්වාධීන කණ්ඩායමක එක් අපේක්ෂකයෙකුගේ ඇප තැන්පතුව රුපියල් 16,000/- දක්වාත් ඉහළ නැංවීම.

* 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතට අනුව පිළිගත් දේශපාලන පක්ෂයකින් ඉදිරිපත් වන එක් අපේක්ෂකයෙකුගේ ඇප තැන්පතුව රුපියල් 6,000/- දක්වාත්, ස්වාධීන කණ්ඩායමක එක් අපේක්ෂකයෙකුගේ ඇප තැන්පතුව රුපියල් 11,000/- දක්වාත් ඉහළ නැංවීම.

## 12. රාජ්‍ය හිමිකාරත්වය සහිත බැංකු ආයතන සම්බන්ධයෙන් යෝජිත ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම

රාජ්‍ය හිමිකාරත්වය සහිත බැංකු ආයතනයන්හි සමස්ත පාලනය, අවදානම් කළමනාකරණය සහ අධීක්ෂණය වැනි ක්ෂේත්‍රයන්හි පවතින දුර්වලතාවන් හේතු කොට ගෙන පසුගිය කාලසීමාව තුළ පැවති ආර්ථික අර්බුදය අතරතුරදී එම බැංකුවලට දැඩි දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදුව ඇත. එබැවින්, එවැනි දුෂ්කරතාවන් නැවත ඇති වීම වැළැක්වීම අරමුණු කර ගෙන එම බැංකුවල සිදු කළ යුතු ප්‍රතිසංස්කරණ ගණනාවක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව හා ශ්‍රී ලංකා මහ බැංකුව යන ආයතනවල සාමාජිකයින්ගෙන් සමන්විත විශේෂඥ කමිටුවක් මගින් හඳුනාගනු ලැබ තිබේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ලබා දෙන ලද විස්තීර්ණ මූල්‍ය පහසුකම් වැඩසටහන තුළ අන්තර්ගත ව්‍යුහාත්මක අවශ්‍යතාවක් වශයෙන් මෙන්ම ලෝක බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම් යටතේ වන මූලික ක්‍රියාකාරකම් වශයෙන් ද එකී ප්‍රතිසංස්කරණයන් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුව ඇත. ඒ අනුව, එම ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රියාත්මක කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**13. කොරියානු ජනරජයේ කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (KOICA) සහයෝගිතාව මත තාක්ෂණ විද්‍යාලයන්හි සහ කාර්මික විද්‍යාලයන්හි මෝටර් රථ වැඩහල් නවීකරණය කිරීම**

කාර්මික අධ්‍යාපන සහ පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ පවතින මරදාන, මහනුවර, බණ්ඩාරවෙල, කෑගල්ල සහ සමන්තුරෙයි කාර්මික විද්‍යාලවල මෝටර් රථ කාර්මික පාඨමාලා වැඩිදියුණු කිරීම පිණිස මෝටර් රථ වැඩහල් 05ක් වැඩිදියුණු කිරීම සඳහා 2013-2015 කාලසීමාව තුළදී කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය විසින් මූල්‍ය සහයෝගිතාව ලබා දී ඇත. මේ වන විට එම වැඩහල් වසර 10ක පමණ කාලයක් භාවිත කර ඇති බැවින් ඒවායේ උපකරණ අලුත්වැඩියා කිරීම, යාවත්කාලීන කිරීම සහ අලුතින් සපයා ගැනීම සිදු කළ යුතුව තිබේ. එම කාර්යයන් සඳහා ඇමෙරිකානු ඩොලර් 75,500ක මූල්‍ය සහායක් ලබා දීමට කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එකඟතාව පළ කර ඇත. ඒ සඳහා දෙපාර්ශ්වය අතර අත්සන් තැබීමට යෝජිත සාකච්ඡා සටහන සඳහා අත්සන් තැබීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**14. "නැකතට පැළයක්" - ජාතික රුක් රෝපණ වැඩසටහන**

2024 වර්ෂයේ අවුරුදු නැකත් සීට්ටුවට අනුව අප්‍රේල් මස 18 දින පෙරවරු 6.16ට ජාතික රුක් රෝපණ නැකත යෙදී ඇත. එම නැකත් වේලාවේදී අපනයන විභවයක් සහිත බහු වාර්ෂික භෝගයක් හෝ ආහාරමය වටිනාකමක් සහිත බහු වාර්ෂික භෝගයක් රෝපණය කිරීම පිණිස මහජනතාව දැනුම්වත් කිරීමටත්, ඒ සඳහා වන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමටත් පියවර ගනු ලබන බව සඳහන් කරමින් කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.

**15. ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත**

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කර අනුමැතිය පිණිස පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා 2023-11-20 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, එකී පනත් කෙටුම්පත ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව, පොදු මහජනතාව ඇතුළු විවිධ පාර්ශ්වකරුවන්ගෙන් ඒ සම්බන්ධයෙන් අදහස්

හා යෝජනා ලැබී ඇති අතර, එම අදහස් හා යෝජනා සමාලෝචනය කර යෝග්‍ය විධිවිධාන එකී පනත් කෙටුම්පතට ඇතුළත් කිරීමටත්, විදුලිබල අංශයේ ප්‍රතිසංස්කරණ පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය වඩාත් හොඳින් පිළිබිඹු කිරීමටත් හැකි වන පරිදි තවදුරටත් සිදු කළ යුතු සංශෝධන හඳුනාගනු ලැබ තිබේ. එලෙස හඳුනාගන්නා ලද සංශෝධන ද ඇතුළත් කරමින් නීති කෙටුම්පත් සම්පාදක විසින් නැවත සකස් කරනු ලැබ ඇති විදුලිබල පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. ඒ අනුව, එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

16. **තෝරාගත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා ප්‍රකාශිත මිල (Indicative Price) හඳුන්වා දීම**

මේ වන විට ශ්‍රී ලංකා රුපියල ඇමෙරිකානු ඩොලරය සහ අනෙකුත් ඇතැම් විදේශ මුදල්වලට එරෙහිව අධිප්‍රමාණය වෙමින් පවතින නමුත් අත්‍යවශ්‍ය ආනයනික ආහාර ද්‍රව්‍යවල සිල්ලර මිලෙහි අඩු වීමක් වෙළෙඳපොළ තුළ නිරීක්ෂණය නොවන බව හඳුනා ගනු ලැබ ඇත. එමෙන්ම, අත්‍යවශ්‍ය ආනයනික ආහාර ද්‍රව්‍යවල තොගබෑම් මිල සහ සිල්ලර මිල අතර සැලකිය යුතු වෙනසක් පවතී. එම තත්ත්වය යටතේ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ මෙහෙයවීම මත පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් තෝරාගත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල ඇස්තමේන්තුගත වෙළෙඳපොළ මිල ගණන් අධ්‍යයනය කර එම මිල ගණන් ප්‍රකාශිත මිල වශයෙන් සතිපතා ප්‍රකාශයට පත් කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබ තිබේ. එමගින්, එම අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල වෙළෙඳපොළ මිල පිළිබඳව වඩාත් සුපරීක්ෂාකාරී වෙමින් එකී ආහාර ද්‍රව්‍ය මිල දී ගැනීමට පාරිභෝගිකයින්ට හැකියාව ලැබෙනු ඇත. එලෙස තෝරාගත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය 09කට අදාළව ප්‍රකාශිත මිල ගණන් පිළිබඳ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ තොරතුරු අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.